# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 281/7 — 1984 ජනවාරි 24 වැනි අඟහරුවාද — 1984.01.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

යූ. ජී. සී—එල්. ඒ/84

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ නියමය

උසස් අධ්‍යාපන අමාත්‍ය ජූනියස් රිචඩ් ජයවර්ධන වන මම, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි, මේ නියමියෙන්, ඒ පනතේ 24 වන වගන්තිය යටතේ සාදනු ලැබ, 1978 දෙසැම්බර් මස 29 වන දින අංක 16/16 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නියමය 1984 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරමි.

ජේ. ආර්. ජයවර්ධන,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

1984 ජනවාරි මස 23 වන දින,
කොළඹ දී ය.

2-205/1

---

යූ. ජී. සී—එල්. ඒ/84

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය යටතේ නියමය

උසස් අධ්‍යාපන අමාත්‍ය ජූනියස් රිචඩ් ජයවර්ධන වන මම, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන්—

(i) කාෂිකර්මය, මානව ශාස්ත්‍ර සමාජ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව සහ විද්‍යාව යන අධ්‍යාපන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබා දීමේ, වැඩිදියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු විශ්වවිද්‍යාලයක් පිහිටුවමි;

(ii) "රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව" යන නාමය සහ අභිධානය ඒ විශ්වවිද්‍යාලයට පවරමි ;

(iii) ඒ විශ්වවිද්‍යාලයේ මූලස්ථානය පිහිටා තිබිය යුතු භූමිභාගය වශයෙන් මාතර නියම කරමි ;

(iv) කෘෂිකර්ම, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා, වෛද්‍ය විද්‍යා සහ විද්‍යා යන පීඨ ඒ විශ්වවිද්‍යාලයට පවරමි ;

(v) මෙහි පහත 1 වන තීරයේ නිශ්චය කොට දක්වා ඇති ඒ විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨය, මෙහි පහත 2 වන තීරයේ ඊට අනුරූපව නිශ්චය කොට දක්වා ඇති අධ්‍යයන අංශවලින් සමන්විත විය යුතු බව නියම කොට දක්වමි :—

| 1 වන තීරය | 2 වන තීරය |
|---|---|
| කෘෂිකර්ම පීඨය | කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය |
| | ශෂ්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | පශු විද්‍යා අධ්‍යයන අංශය |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය |
| | භූගෝල විද්‍යා අධ්‍යයන අංශය |
| | ඉතිහාසය හා සමාජ විද්‍යා අධ්‍යයන අංශය |
| | සිංහල අධ්‍යයන අංශය |
| වෛද්‍ය විද්‍යා පීඨය | කායවච්ඡේද විද්‍යා අධ්‍යයන අංශය |
| | ජෛව රසායන විද්‍යා අධ්‍යයන අංශය |
| | ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | ධාත්‍රී හා සූත විද්‍යා හා නාරීයවේද අධ්‍යයන අංශය |
| | ළමා රෝග වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | ව්‍යාධි නිධාන විද්‍යා අධ්‍යයන අංශය |
| | කායික විද්‍යා අධ්‍යයන අංශය |
| | ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| විද්‍යා පීඨය | උද්භිද විද්‍යා අධ්‍යයන අංශය |
| | රසායන විද්‍යා අධ්‍යයන අංශය |
| | ගණිත විද්‍යා අධ්‍යයන අංශය |
| | භෞතික විද්‍යා අධ්‍යයන අංශය |
| | සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශය |

(vi) මේ නියමය ක්‍රියාත්මක විය යුතු දිනය වශයෙන් 1984 පෙබරවාරි 1 වන දින නියම කරමි.

ජේ. ආර්. ජයවර්ධන,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

1984 ජනවාරි මස 23 වන දින,
කොළඹ දී ය.

2—205/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී